300520

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් සහ පුවත්පත් පත්‍ර
රෙජිස්ට්‍රාර් කාර්යාලය
2 9 AUG 2001
ශ්‍රී ලංකා SRI LANKA ශ්‍රී ලංකා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1063 /16 – 1999 ජනවාරි 21 වැනි බ්‍රහස්පතින්ද – 1999.01.21
1063 / 16 ஆம் இலக்கம் - 1999 ஆம் ஆண்டு சனவரி மாதம் 21 ஆம் திகதி வியாழக்கிழமை
No. 1063 / 16 – THURSDAY, JANUARY 21, 1999

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ජෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී. – බී. 9/96.

### 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20 වන වගන්තිය සමග කියවිය යුතු 25 වන වගන්තිය යටතේ සමාජ සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

බර්ටි ප්‍රේමලාල් දිසානායක,
සමාජ සේවා අමාත්‍ය.

1999 ජනවාරි මස 05 වැනි දින දී ය.

### නියෝග

01. මේ නියෝග 1999 අංක 01 දරන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ආබාධ සහිත තැනැත්තන්ට සේවා හෝ ආධාර සපයන හෝ සැපයීමට කැමති සෑම ස්වේච්ඡා සංවිධානයක් ම එය සභාව වෙත ලියාපදිංචි කිරීම සඳහා මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි වූ I වන ආකෘතියේ ලා ජාතික සභාවේ ලේකම්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

03. ලියාපදිංචි කිරීම සඳහා වූ ස්වේච්ඡා සංවිධානවල සෑම ඉල්ලුම් පත්‍රයක් ම එම සංවිධානයේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතු අතර ඒ සමග –

(i) එහි අන්තිම වාර්ෂික මහ සභා රැස්වීමේ වාර්තාවේ පිටපතක් ;

(ii) එහි ව්‍යවස්ථාවේ පිටපතක් ;

(iii) ක්‍රියාකාරකම් සහ අරමුදල පිළිබඳ ප්‍රකාශයක් ; හා

(iv) උපලේඛනයේ දක්වා ඇති පරිදි II වන ආකෘතියේ සාමාජිකයන්ගේ ලැයිස්තුවක් සහ ඔවුන්ගේ විස්තර තිබිය යුතු ය.

04. ස්වේච්ඡා සංවිධානයක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇති බවට සභාවේ ලේකම්වරයා සෑහීමට පත්වුවහොත් ඔහු විසින් එම සංවිධානය ලියාපදිංචි කළ යුතු අතර මෙහි උපලේඛනයේ දක්වා ඇති III වන ආකෘතියේ විය යුතු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය.

05. ලේකම්වරයා විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ සෑම සංවිධානයක් ම එහි නම, ලිපිනය, එය ඉටු කිරීමට බලාපොරොත්තු වන සේවා ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

06. ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් සභාවේ ලේකම්වරයා විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන අවස්ථාවක, ඔහුගේ තීරණය ද ඊට හේතු ද දින දාහතරක් ඇතුළත ඉල්ලුම්කර සංවිධානයට ඔහු විසින් දැන්විය යුතු ය.

07. යම් ස්වේච්ඡා සංවිධානයක් ලියාපදිංචි කිරීමට ප්‍රතික්ෂේප කරමින් සභාවේ ලේකම්වරයා විසින් කරන ලද තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම ප්‍රතික්ෂේප කිරීමෙන් දින තිහක් ඇතුළත අමාත්‍යවරයාට අභියාචනා කළ හැකි ය. ඒ මත අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

08. සභාවේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක්, එහි සඳහන් ස්වේච්ඡා සංවිධානයේ ලියාපදිංචිය අවලංගු කර ඇති බව ඔප්පු කළහොත් මිස එම සංවිධානය නිසි ලෙස ලියාපදිංචි කර ඇති බවට තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

09. සෑම ස්වේච්ඡා සංවිධානයක් විසින් ම එහි කාර්යාලයේ පහත දැක්වෙන ගිණුම් පොත්, ලෙජර් සහ ලේඛන පවත්වාගෙන යා යුතු අතර ඒවා පනතේ 33 වන වගන්තිය යටතේ සභාවේ බලයලත් නිලධරයකු විසින් දවසේ සියලු සාධාරණ වේලාවල්වල ද පරීක්ෂා කිරීම සඳහා විවෘතව තැබිය යුතු යː–

(i) මුදල් පොත (බැංකු ගිණුම් ඇතුළුව) ;

(ii) සුළු මුදල් පොත ;

(iii) ප්‍රධාන ලෙජරය ;

(iv) ප්‍රධාන ජර්නලය ;

(v) සාමාජිකයන්ගේ රෙජිස්ටරය ;

(vi) සාමාජික ගාස්තු ලෙජරය ;

(vii) ණයකරුවන්ගේ හා ණයහිමියන්ගේ ලෙජරය ;

(viii) උප පත්‍රිකා ;

(ix) කුවිතාන්සි පොත් ;

(x) වත්කම් රෙජිස්ටරය ;

(xi) කමිටු රැස්වීම්වල සහ මහ සභා රැස්වීම්වල වාර්තා ;

(xii) කාර්ය මණ්ඩල විස්තර ;

(xiii) පත්වීම් ලිපි අඩංගු ලිපිගොනු ;

(xiv) වැටුප් විස්තර ;

(xv) පනත්, නියෝග, ගැසට් ආදිය ;

(xvi) වෙනත් අදාළ ලේඛන.

10. සෑම ලියාපදිංචි සංවිධානයක් ම කළමනාකරණ කමිටුවක් සංයුක්ත කළ යුතු අතර එය පහත දැක්වෙන කටයුතු ගැන වගකීම දැරිය යුතුය :–

(i) පනත යටතේ සභාවේ ලේකම්වරයා විසින් නීත්‍යානුකූලව නිකුත් කරන ලද විශේෂ හෝ පොදු විධාන ක්‍රියාත්මක කිරීම ;

(ii) සංවිධානයේ වත්කම් හා බැරකම් පිළිබඳ සත්‍ය හා නිවැරදි ගිණුම් පවත්වාගෙන යෑම ;

(iii) විගණනය කළ ආදායම් සහ වියදම් ප්‍රකාශයක් සැපයීම සහ සංවිධානයේ වාර්ෂික මහ සභා රැස්වීමේ දී එය අනුමත කරවා ගැනීම ;

(iv) පහත දැක්වෙන කාරණා ගැන රීති සකස් කිරීම :–

(අ) සංවිධානයේ මූල්‍ය ක්‍රියා පටිපාටිය ;

(ආ) සාමාජිකයන් බඳවා ගැනීම ;

(ඇ) සාමාජිකයන්ගේ වගකීම ;

(ඈ) මහ සභා රැස්වීම් සහ කමිටු රැස්වීම් පැවැත්වීම ;

300520



(iv) සංවිධානයේ අරමුදල්වලට ගැලපෙන පරිදි ව්‍යාපෘති සහ ක්‍රියා මාර්ග සැළසුම් සකස් කිරීම ;

(v) අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා සභාවට සැපයීම.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල –

"පනත" යන්නෙන් 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන් ආරක්ෂා කිරීමේ පනත අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් සමාජ සේවා විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

(3 වන නියෝගය).

**උපලේඛනය**

**I වන ආකෘතිය**

**ස්වේච්ඡා සංවිධානයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය**

01. ස්වේච්ඡා සංවිධානයේ සම්පූර්ණ නම :————.

කෙටි නම (අදාළ නම්) :————.

02. පිහිටුවනු ලැබූ දිනය :————.

03. ස්ථිර ලිපිනය :————.

දුරකථන අංකය :————.

ෆැක්ස් අංකය :————.

පළාත් සභාව :————.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

ජාතික ... ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර
රෙජිස්ට්‍රාර් කාර්යාලය
29 AUG 2001
ශ්‍රී ලංකා SRI LANKA

04. සංවිධානයේ අරමුණු සහ ක්‍රියාකාරකම්වල ස්වභාවය (පසුගිය අවුරුදු දෙක සඳහා ප්‍රගති වාර්තාවක් අමුණන්න) :————.

05. ප්‍රදේශය සහ මෙහෙයුම් මට්ටම (ජාතික/පළාත්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය/ගම් මට්ටම) :————.

06. මුළු සාමාජිකත්වය :————.

07. විධායක කමිටු සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් :

| තනතුර | නම | පුද්ගල ලිපිනය | පත්වීමේ දිනය |
|---|---|---|---|
| සභාපති | | | |
| උප සභාපති | | | |
| ලේකම් | | | |
| භාණ්ඩාගාරික | | | |

08. ආදායම් මාර්ග (පසුගිය අවුරුදු හතර සඳහා ලැබුණු විදේශ ආධාර ඇත්නම් ඒවා ඇතුළුව (ප්‍රදායක නියෝජ්‍යායතනයේ නම සහ ලිපිනය, ප්‍රදානවල ගණන් සහ පරමාර්ථය) මුදලින් සහ ද්‍රව්‍යවලින් ලැබුණු ආධාර වෙනම සඳහන් කරන්න. (වාහන, උපකරණ, විදුලිත් අයිතම ආදිය) විගණනය කළ ගිණුම් ප්‍රකාශයක් අමුණන්න) :————.

09. ප්‍රධාන වියදම් අයිතම (ලේඛන මුදලින් කරන්න) :————.

10. සංවිධානයේ වත්කම් :————.

11. (i) උප කාර්යාල ගණන (විස්තර වෙනම අමුණන්න) :————.

(ii) ලිපිනය :————.

(iii) දුරකථන අංකය :————.

(iv) පිහිටුවනු ලැබූ දිනය :————.

(v) ආයතන ප්‍රධානීන්ගේ නම් :————.

12. වෙනත් යම් විස්තර :————.

13. ප්‍රකාශය :

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධානවලින්, ඒ පනත යටතේ සාදන ලද යම් රීතිවලින් සහ ජාතික සභාව විසින් කලින් කල නිකුත් කරනු ලබන අනිකුත් සියලු විධානවලින් බැඳී සිටීමට.................................................,..................................................................වන මම මෙයින් එකඟ වෙමි.

(සංවිධානයේ නම) (ලේකම්වරයාගේ නම)

තව ද මේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් සියලු විස්තර මගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි.

————,
සංවිධානයේ ලේකම්ගේ අත්සන.

සංවිධානයේ මුද්‍රාව :
දිනය :————.
(ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවල විස්තර වෙනම අමුණන්න.)

---

(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි.)

ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිරීක්ෂණ සහ නිර්දේශ :————.

————,
ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන.

————,
(ප්‍රාදේශීය ලේකම්වරයාගේ නම).

දිනය :————.
මුද්‍රාව :————.

---

(අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා පමණි.)

ලියාපදිංචිය අනුමත කරන ලදී :
අනුමත කර නැත්නම් හේතු :

බලය දෙන නිලධරයා :
නම :
දිනය :
අත්සන :

අනුමත ලියාපදිංචි අංකය :
දිනය :

(3 වන නියෝගය.)

II වන ආකෘතිය

1. නම :——.
2. ලිපිනය :——.
3. වයස :——.
4. රැකියාව :——.
5. සංවිධානයට බැඳුනු දිනය :——.
6. සාමාජිකත්වය නැති වූ දිනය :——.
7. අත්සන :——.

(4 වන නියෝගය.)

III වන ආකෘතිය

ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමේ සහතිකය (20 වන වගන්තිය)

........................................................................................ හි ..................................................................................

(සංවිධානයේ ලිපිනය) (සංවිධානයේ නම)

.......................................................1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20 වන වගන්තිය යටතේ අද දින සභාව විසින් මෙයින් ලියාපදිංචි කරන ලද බව ආබාධ එකී තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ජාතික සභාවේ ලේකම්.......................................................මහතා/මහත්මිය/මෙනෙවිය වන මම මෙයින් සහතික කරමි.

ලියාපදිංචි කිරීමේ අංකය :——.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ
ජාතික සභාවේ ලේකම්.

දිනය :——.
පිටපත් :——.

02 – 148

# பகுதி I: தொகுதி (I) – பொது

## அரசாங்க அறிவித்தல்கள்

ச.வ.- பீ 9/96.

### 1996 ஆம் ஆண்டின் 28 ஆம் இலக்க, அங்கவீனமுற்ற ஆட்களின் உரிமைகள் பாதுகாப்புச் சட்டம்

1996 ஆம் ஆண்டின் 28 ஆம் இலக்க, அங்கவீனமுற்ற ஆட்களின் உரிமைகள் பாதுகாப்புச் சட்டத்தின் 20 ஆம் பிரிவுடன் சேர்த்து வாசிக்கப்படும் 25 ஆம் பிரிவின் கீழ் சமூக சேவைகள் அமைச்சரால் செய்யப்பட்ட ஒழுங்குவிதிகள்.

பேர்டீ பிரேமலால் திஸாநாயக்க,
சமூக சேவைகள் அமைச்சர்.

1999 சனவரி 05.

### ஒழுங்குவிதிகள்

1. இவ்வொழுங்குவிதிகள், 1999 ஆம் ஆண்டின் வலிந்துதவு ஒழுங்கமைப்புகளைப் பதிவுசெய்யும் ஒழுங்குவிதிகள் என எடுத்துக்காட்டப்படலாம்.

2. அங்கவீனமுற்ற ஆட்களுக்கு சேவை புரிவதற்கு அல்லது உதவி புரிவதற்கு ஏற்பாடு செய்கின்ற அல்லது விரும்புகின்ற ஒவ்வொரு வலிந்துதவு ஒழுங்கமைப்பும் அதனைத் தேசிய சபையில் பதிவு செய்து வைத்திருப்பதற்கென சபையின் செயலாளருக்கு, இதனகத்து அட்டவணையில் தரப்பட்டுள்ளவாறான படிவம் 1 இல் விண்ணப்பித்தல் வேண்டும்.

3. பதிவு செய்யப்படுவதற்கான வலிந்துதவு ஒழுங்கமைப்பின் ஒவ்வொரு விண்ணப்பமும், அத்தகைய ஒழுங்கமைப்பின் செயலாளரால் செய்யப்படுதல் வேண்டுமென்பதுடன் பின்வருவனவற்றையும், அன்வையாவன –

# PART I : SECTION (I) – GENERAL

## Government Notifications

L. D.– B. 9/96.

**PROTECTION OF THE RIGHTS OF PERSONS WITH DISABILITIES ACT, No. 28 OF 1996**

REGULATIONS made by the Minister of Social Services under Section 25 read with Section 20 of the Protection of the Rights of Persons with Disabilities Act, No. 28 of 1996.

BERTY PREMALAL DISSANAYAKE,
Minister of Social Services.

05th January, 1999.

NATIONAL LIBRARY N L S L OF SRI LANKA

**Regulations**

01. These regulations may be cited as the Registration of Voluntary Organisations Regulations, No. 1 of 1999.

02. Every voluntary organisation which provides or is desirous of providing services or assistance to persons with disability shall apply in Form I, as set out in the Schedule hereto to the Secretary to the National Council to have it registered with the council.

03. Every application of voluntary organisations for registration shall be made by the Secretary of such organisation and shall accompany –

(i) a copy of the minutes of its last Annual General Meeting ;

(ii) a copy of its Constitution ;

(iii) a statement on the activities and objects ; and

(iv) a list of members and their details in Form II, as set out in the Schedule.

04. If the Secretary to the Council is satisfied that a voluntary organisation has complied with the provisions of the Act, he shall register such organisation and issue a certificate of registration which shall be in Form III set out in the Schedule hereto.

05. Every organisation which have been issued with a certificate of registration by the Secretary shall publish in the *Gazette*, its name, address, services it proposes to render.

06. Where the Secretary to the Council decides to reject an application for registration, he shall inform the applicant–organisation of his decision and his reasons therefor within fourteen days.

07. Any person aggrieved by the decision of the Secretary to the Council refusing to register and voluntary organisation may, within thirty days of such refusal appeal to the Minister. The Minister's decision thereon shall be final and conclusive.

08. A Certificate of registration signed by the Secretary to the Council shall be conclusive evidence of the fact that the voluntary organisation therein mentioned is duly registered, unless this proved that the registration of such organisation had been cancelled.

09. Every registered voluntary organisation shall maintain at its office the following books of accounts, ledgers and documents which shall be open at all reasonable hours of the day for inspection by an authorised officer of the Council under Section 33 of the Act :–

(i) Cash Book (including Bank Accounts) ;

(ii) Petty Cash Book ;

(iii) Main Ledger ;
(iv) Main Journal ;
(v) Membership Register ;
(vi) Membership Fee Ledger ;
(vii) Debtors and Creditors Ledger ;
(viii) Counter Foils ;
(ix) Receipt Books ;
(x) Register of Assets ;
(xi) Minutes of Committee Meetings and General Meeting ;
(xii) Details of Staff ;
(xiii) Files containing letters of appointment ;
(xiv) Salary Particulars ;
(xv) Acts, Regulations, *Gazette* etc. ;
(xvi) Other relevant documents.

10. Every registered organisation shall constitute a Management Committee which shall bear the responsibility of –

(i) carrying out special or general directions lawfully issued by the Secretary to the Council under the Act ;
(ii) maintaining true and accurate accounts of the assets and liabilities of the organisation ;
(iii) providing an audited statement of income and expenditure and having it approved at the Annual General Meeting at the organisation ;

(iv) formulating rules on the following matters :
(a) Financial procedure of the organisation ;
(b) Enrolment of members ;
(c) Responsibility of members ;
(d) Holding of general meetings and committee meetings ;
(e) Preparation of projects and actions plans in line with the objectives of the organisation ;

(v) Providing bi-annual progress reports to the Council :

11. In these regulations unless the contest otherwise requires –
" Act " means the protection of Rights of Persons with Disabilities Act, No. 28 of 1996 ;
" Minister " means the Minister-in-charge of the subject of social services ;
" Secretary " means the Secretary to the Ministry of the Minister-in-charge of social services .

*(Regulation 3)*

SCHEDULE

FORM I

APPLICATION FOR REGISTRATION OF VOLUNTARY ORGANIZATION

1. Full name of the voluntary organisation:——.
Short name (if applicable):——.
2. Date of establishment:——.

3. Permanent address :——.
   Telephone No. :——.
   Fax No. :——.
   Provincial Council :——. District :——.
   Divisional Secretary's Division :——.
   Grama Niladhari Division :——.

4. Objectives and nature of the activities of the Organization (Please annex a brief report for the last two years) :——.

5. Area and level of operation ( National / Provincial / District / Divisional / Village Level ) :——.

6. Total membership :——.

7. Names and addresses of executive committee members :

| *Post* | *Name* | *Private Address* | *Date of Appointment* |
|---|---|---|---|
| Chairman<br>Vice-Chairman<br>Secretary<br>Treasurer | | | |

8. Sources of income (Including foreign assistance ,if any–Name and address of the donor agency, amounts, purpose of the donations received for the last four years. Indicate the assistance received in cash and kind – vehicles, equipment, electronic items etc. separately. Please attach the audited statements of accounts) :——.

9. Main items of expenditure ( Please submit documents) :——

10. Assets of the organization :——.

11. (i) No. of sub-offices (attach particulars separately) :——.
    (ii) Addressses :——.
    (iii) Telephone Nos. :——. Fax Nos. :——.
    (iv) Dates established :——.
    (v) Names of heads of institutions :——.

12. Any other particulars :——.

13. Declaration.– I ........................................................of ............................................. hereby agree to abide by the provisions of the
(Name of secretary) (Name of organization)
Protection of the Rights of Persons with Disabilities Act, No. 28 of 1996 and any rules and regulations made under that Act and all other directions issued by the National Council from time to time. Further I cretify that all particulars mentioned in this application are true and accurate according to my knowledge.

Seal of the Organisation :

——————,
Signature of the Secretary of the Organization.

Date :——————

(Please annex details separately at the places where adequate space is not available.)

---

(For office use)

Observations and recommendations of the Divisional Secretary :——.

——————,
Signatureof the Divisional Secretary.

——————
Name of the Divisional Secretary.

Date :——————.
Seal :——————.

(For Ministry's use only)

Registration Approved :——.
Reasons if not approved :——.

Authorizing Officer :
Name :——.
Date :——.
Signature :——.

Approved Registration No. :——.
Date :——.

*(Regulation 3).*

FORM II

1. Name : ——.
2. Address : ——.
3. Age : ——.
4. Employment : ——.
5. Date of joining the organisation : ——.
6. Membership discontinued on : ——.
7. Signature : ——.

*(Regulation 4).*

FORM III

CERTIFICATE OF REGISTRATION OF VOLUNTARY ORGANIZATIONS (SECTION 20)

I, Mr. / Mrs. / Miss ...................................................... the Secretary to the National Council for Persons with Disabilities, certify, that.......................................................................................................................................................

(name of the organisation)

of.......................................................................................................................................................

(address of the organisation)

is hereby registered with the Council today, under Section 20 of the Protection of the Rights of Persons with Disabilities Act No. 28 of 1996.

Registration No. : ——.

Secretary,
National Council for Persons with Disabilities.

Date : ——.
Copies : ——.

02 – 148

NATIONAL LIBRARY N L S L OF SRI LANKA

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.